

# සසල දිවිමග නිසල කරනට

**(ආතතිය, මානසික පීඩනය පාලනය කරගැනීමට අත්වැලක්)**

**පූජ්‍ය බෝධි චිත්තා මෙහෙණින් වහන්සේ**
මෙල්බන් නුවර නිසල අරණ

14

## දැවෙන සිත් නිවී සැනසේවා

අප බුදු රජාණන් වහන්සේ පහළ වූ කාලයේදී විශාල ආගම් ප්‍රමාණයක් ඉන්දියාවේ තිබූ බව ඉතිහාසයේ සඳහන් වේ. මින් ආගම් කිහිපයක් හැරුණු විට ඉතිරි සියල්ල කාලයත් සමග වැලිතලාවන්ට යට වී හමාරය (ලොව හතු පිපෙනවාක් මෙන් විවිධ ආගම් ඇති වී, නැති වී යාම ස්වභාවික සංසිද්ධියකි). ඉතිරි වී ඇති ආගම් කීපය අතර හින්දු ආගමටද වඩා ලොව පුරාම ප්‍රචලිතව ඉතා සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින්නේ බුදු දහමයි. වසර 2600 ක් තරම් කාලයක් තුළදී නොකැඩී, අඛන්ඩව බුදුදහම ලෝකයේ පැවතී ඇත. මෙතරම් දිගු කාලයක් තුළ මෙම බුදුදහම නොනැසී පැවතීමට හේතු වී ඇත්තේ අන් ආගම් වල නැති එහි ඇති සුවිශේෂී වූ ලක්‍ෂණයි. එය මනුෂ්‍යයාගේ බුද්ධිමය බල මහිමයට මුල් තැනක් දෙමින්, අවිහිංසාව පෙරදැරිව, ගුණය නුවණ වඩන්නා වූ පිළිවෙතින් යුතුව, සත්‍යයේ මුල් බැස ගත්තා වූ ආගමක්, දර්ශනයක් වන නිසාත්, මෙය මනා කොට දේශනා කරන ලද, අවබෝධ කරගන්නවුන්ට මෙය පිළිපදින්නන්ට, ඒ ඒ මොහොතේදීම ප්‍රතිඵල ගෙනදෙන, යම් කාලයකට පමණක් සීමා නොවුන අතීත, වර්තමාන, අනාගත යන සියළු කල්හිම ප්‍රතිඵල ගෙන දීමට සමත්, ඕනෑම කෙනෙකුට මේ ධර්මයට එව, බලව යැයි කියන්නට සුදුසු, මේ ශ්‍රී සද්ධර්මය තම තමා විසින්ම, තම නුවණින් අවබෝධකර ගැනීමට ඇති හැකියාව නිසාත්ය. බුදුරජාණන් වහන්සේ අන්‍යාගමිකයන්ට ධර්ම දේශනා කිරීමේදී ඔවුන් විශ්වාසකරන්නා වූ, අදහන්නාවු දෙයට සමීප වී, එය නිවැරදි ආකාරයෙන් කරගෙන යාමට මග පෙන්වා දුන් ආකාරය සිගාලෝවාද සූත්‍රය ආදි සූත්‍රවලින් පෙනී යයි. වැරදි අන්ධ විශ්වාසයන් මුල් කරගෙන දශ දිශාවට වඳිමින් සිටි

"සිගාල ගෘහපතිට" එය පලකට නැති වැඩක් යැයි පවසා වැලැක්වීමට උත්සාහ නොගෙන එය අර්ථවත් අයුරින් කළ යුතු ආකාරය පමණක් පෙන්වා දුන් සේක. එසේම ගංගා නම් නදියේ නාමින් පව් සෝදමින්, සිත පිරිසිදු කිරීමට උත්සාහ ගනිමින් සිටි බමුණන්ටද කීප අවස්ථාවකදීම දහම ගංගාවකට උපමා කරමින් නියම ආකාරයෙන් සිත පිරිසිදු කරගන්නා ආකාරය දේශනාකල සේක. මෙසේ සමාජයේ ඒ ඒ තරාතිරම්වල සිටි, විවිධ අධ්‍යාපනික මට්ටම් ඇති විවිධ විශ්වාසයන් ඇති විවිධ කුල, ජාති, ආගම් වලට අයත් වුවන්හට බුදුරජාණන් වහන්සේ ඒ ඇත්තන්ට ඔවුන් පහසුවෙන්ම පිළිගන්නා මතයන්හි සිටිය දීම ඒ ඒ අයට, තැනට, කාලයට, පිරිසට, පරිසරයට අදාළ වන පරිදි ධර්මය දේශනා කරන ලද හෙයින් එකල ධර්මය ඉතා ඉක්මනින්ම ප්‍රචලිත කිරීමට හැකි විය. බුදුවීමෙන් පසු මාස කිහිපයක් ඇතුළත තම අනුගාමිකයන් ගණනින් 10,000 ඉක්ම විය. බුදුරජාණන් වහන්සේගේ බුදු වීමෙන් පසු අවුරුදු 45 වැනි කෙටි ජීවිත කාලය තුළදී ලක්‍ෂ සංඛ්‍යාත ජන ගංගාවක් බුදුන්වහන්සේ අනුගමනය කරමින් ඇදුන බවට ඉතිහාසයේ ලියැවුණු සාක්‍ෂි ඇත. අද ලෝකයේ වඩාත් පැතිරුනු ක්‍රිස්තියානු ආගමේ නායකයා වූ ජේසුතුමන් ලොව පහළ වී සිටි කෙටි කාලය තුළදී එතුමන්ට සිටියේ අනුගාමිකයින් 12 දෙනෙක් පමණි. බුදු දහම ප්‍රචාරය කිරීම විසින් ඉහත කී කරුණු සැලකිල්ලට ගෙන බැලීමෙන්, බුද්ධ චරිතය අධ්‍යයනය කිරීමෙන්, මෙකල අප කෙසේ නම්, සාර්ථක ලෙස ධර්ම ප්‍රචාරය කල යුත්තේද යන්න ගැන සිතා බැලීම වටී.

ලංකාවට මිහිඳු මාහිමි වැඩිකල මෙහි සිටි ජනතාව විශ්වාස කර ඇත්තේ අමනුෂ්‍යයන් ගැනය. නොපෙනෙන බලවේගයන්ට පුජා තබමින්, ආරක්‍ෂාවට, පිහිට පතමින් ජීවත් වන්නෝ වූහ. මිහිඳු මාහිමියන් ලංකාවට වැඩ දෙවැනි දිනයේදී රාජ මාළිගාවේදී දේශනා කර ඇත්තේ ප්‍රේත වතතු හා විමාන වතතු වේ. දුක් විඳින ප්‍රේතාත්ම හා දෙව්ලොව සැප විඳින දෙවියන් ඒ තත්ත්වයට පත්වූයේ කෙසේද යන්න මෙම දේශනාවෙන් විස්තර කල පසු රජ පවුල ඇතුළු රජ මාළිගයේ සිටි සැම, බුද්ධාගම වැළඳගන්නා ලදී.

මෙහිදී ද මිහිඳු හිමියන් විසින් අනුගමනය කර ඇත්තේ එකල සිටි පිරිස තදින් විශ්වාස තැබූ සමීප වූ දේ උපයෝගී කරගනිමින් ඒ තුළින් දහම ඉස්මතු කර පෙන්වීමය.
මෙකල මානව වර්ගයා විශ්වාසය තබා ඇත්තේත්, සමීපකමක් ඇත්තේත්, තම ආරක්‍ෂාව පතන්නේත් විද්‍යාව තුළින් බව අප නොතකා හැරීම, අවධානය යොමු නොකිරීම බුදු දහමේ ප්‍රචාරනයට ඍණාත්මකව බල නොපෑහැකි යැයි කාට නම් කිව හැකිද? බුදු දහම මනාව හැදෑරූ ධර්ම ප්‍රචාරය පිණිස හිතැත්තෝ විද්‍යාව පිළිබඳ, අන්‍ය භාෂා පිළිබඳව, (අඩුතරමින් ඉංග්‍රීසි දැනුම) හා අන්‍ය ආගම් ගැනද මනා ලෙස හදාරා තිබීම වැදගත් වේ. තමා ධර්මය අවබෝධ කර ගැනීම හා එහි පිහිටා සිට ක්‍රියාකිරීම ද ඉතා සාර්ථක ධර්ම ප්‍රචාර වැඩපිළිවෙලකට මඟපාදයි.

විද්‍යාව හෝ උපයෝගී කරගනිමින් බුදු දහම පතුරුවන්නට වෙරදරන්නන්හට උදව් කිරීම මිස, ඔවුනට හරහා ධර්ම ප්‍රචාරය අඩාල කිරීම කළ යුත්තක්ද යන්න සිතා බැලීමට ඔබහට භාරකරමි.

### ආගම් භේද මුල්කර ගෙන වාද විවාද වලට පැටලී Strees වන්නන් හට

● ඉපැදෙන විට ආගම තබා අප දිවා රෑ පටලාගෙන සිටින්නා වූ හැඳිවත වත් නොමැතිව ඉපදුන බව මතක් කරගන්න.
● ඉපදුන පසු අප අවට සිටින්නවුන් ගේ විශ්වාස, බලපෑම් මත අප හට ආගමකට නිරායාසයෙන්ම උරුමකම් කීමට සිදුවිය. ලොව කීයෙන් කීදෙනෙක් සිටීද තම උවමනාවට, තම බුද්ධියට අනුකූලව තම සිතැගි පරිදි ආගමක් තෝරා ගත්තවුන්? තමුන්ට කැමති ආගමක් ඇදහීමට නිදහස ලබාගත්තවුන් කී දෙනෙක් නම් අප අතර සිටීද?

● බුදුන්වහන්සේගේ, ජේසුතුමන්ගේ හා නබිනායකතුමන්ගේ, මහා බ්‍රහ්මයාගේ ආගම කුමක්වේ දැයි ඇසුවහොත් මෙම උතුමන්ලා කුමක් පවසාවිද? වරෙක මේ දශකයේ ගෞරවයට පාත්‍ර වූ ඉන්දීය ආගමික නායකයෙකුගෙන් මේ ප්‍රශ්නය ඇසූ විට පැවසුවේ "ඕම් ශාන්ති" පරම ශාන්තිය, නිවීම, සැනසීම එතුමන්ගේ ආගම බවයි.

● ලොව පහළ වූ සියලු ආගමික නායකයෝ ලෝක වැසියන්ගේ හිතසුව පිණිස කළ යුතු දේ, දියුණු කළ යුතු දේ හා නොකළ යුතු දේ හා නොවැඩිය යුතු දේ පෙන්වා දුන්හ. මොවුහු හරි වැරදි, හොඳ, නරක ලොවට පෙන්වා දුන්හ. මේ සියලු දෙනා ඉවසීම, මෛත්‍රිය, නිවීම ආදි උතුම් ගුණ උසස් කොට සැලකූහ. මේ ලැබුනා වූ උපදෙස් වලට අනුකූලව තම ජීවිත ආලෝකමත් කර ගැනීම වෙනුවට, මනුෂ්‍ය වර්ගයා, ආගමික නායකයන් දේශනා කළ දේ පසෙක තිබියදී තම තමුන්ට සිතැගි පරිදි ඒ ඒ ආගමික නායකයන්ව අයිති කර ගනිමින් "මම අහවල් ආගමේ" යැයි පවසමින් ද්වේශය පෙරදැරි කරගෙන ආත්මාර්ථකාමීත්වය මුල් කරගනිමින්, කල්ලි ගැසීමෙන් විවිධ වූ කණ්ඩායම් බිහිවීමට පටන් ගත් පසු ආගම් භේද ඇති විය.

● සියලුම ආගමික නායකයන් අතුරෙන් ලොව පහල වූ ශ්‍රේෂ්ඨතම නායකයා බුදුරජාණන් වහන්සේ බව ලොව වසනා බොහෝ විද්වතුන්, බුද්ධිමතුන් පිළිගන්නා කරුණකි. එයට හේතුව නම් බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යත්වය ඔබ්බවා යෑමයි. සියලු මනුෂ්‍ය දුර්වලතා ලෝභ, ද්වේශ, මෝහ (ආශාවන්, තරහවන්, ආත්මාර්ථකාමීත්වය ආදි වශයෙන් ඇති සියලු චිත්තාවේග ඍපදඑසදබ) දුරුකර, වැඩිය යුතු සියළු ගුණාංග (දාන, සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, වීරිය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා හා උපෙක්ඛා) පරිපූර්ණ ලෙස වැඩූ හෙයි නුත් තම බුද්ධිය දියුණු කර මේ තුන් ලොවේ ඇති සියලු දේ ඇති සැටියෙන් අවබෝධ කර ගැනීමට තරම් ප්‍රඥාවන්ත බවේ හිනි පෙත්තටම නැග පරිනාමයේ ඉහලම සංකේතය බවට පැමිණි හෙයි නුත් ලොව පහල වූ ශ්‍රේෂ්ඨ උතුමන් අතරින් බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨතමයාණන් වන්නේය.

මෙසේ සියලු දේ කෙළ පැමිණි බුදුරජාණන් වහන්සේ කිසිවකුත් සමග අඬ දබර, රන්ඩු සරුවල් වලට පැටලුනේ නැත. බුද්ධ ශ්‍රාවකයන්, හා අනුගාමිකයන් ලෝක ඉතිහාසයේ කෙදිනක හෝ



බෞද්ධ දර්ශනය මුල් කරගෙන බෞද්ධාගමේ නාමයෙන් අන්‍යන් සමග කලකෝලහාල, යුද්ධ, ඇතිකර ගත් බවට අදටත් සාධක හමු වී නැත. මෙය සියලු බෞද්ධයන්ට වැදගත් පණිවිඩයකි. බෞද්ධ යා යනු දුක් විඳීමට අකැමැති, අවිහිංසාව මුල්කර ගත් පරාර්ථකාමී චින්තනයකින් හෙබි ගුණය, නුවණ මුල් කරගෙන දුකෙන් මිදීමට මං සාදාගන්නෙක් වේ.

● උතුම් වූ බෞද්ධයන්ට අන්‍ය ආගම් විවේචනය, පහත් කොට ගැරහීම වැනි ක්‍රියාවල යෙදීම නොතරම් ය. බුද්ධ දේශනාවලට අනුකූලව අන්‍ය ආගම් පහත් කර කතා කරන්නා කරගන්නේ තම ආගම පහත් කර ගැනීමකි.
● මුළු මහත් ඉන්දියාව පුරාම බලසක පැවැත්වූ ධර්මාශෝක අධිරාජ්‍යයා, බෞද්ධයෙකු වුවද තම රට වැසියා ඇදහූ සියළු ආගම් වලට භේදයකින් තොරව පහසුකම් සැලසීය.

මෙතුමාගේ මේ සත් ක්‍රියාව දැක බොහෝ මැති ඇමතිවරුන් බෞද්ධයන් බවට පත් වී ඇත්තේ මේ දර්ශනයේ ඇති උතුම් බව අවබෝධ කොට ගෙනය. මෙතුමාගෙන් තරම් බුද්ධ ශාසනයේ චිරස්තථිය උදෙසා සේවයක් ඉටු වූ අන් කිසි රජකෙනෙකුන් ගැන පොත පතේ සඳහන් වී නොමැති තරම්ය. උග්‍ර බෞද්ධයෙකු වූ මෙතුමා අන්‍ය ආගම් වලට ගරු කෙරුවේ ආදර්ශවත් බෞද්ධයකු හැටියටය.
● අප බුදුරජාණන් වහන්සේ අන්‍යාගමිකයකු, බෞද්ධ වන්නට කැමැත්ත පලකළ පසු ඔවුන්ට තම අනුගාමිකයකු වීමට අවසර දිමේ දී අනුගමනය කළ ක්‍රමවේද ගැන අපගේ ද අවධානය යොමු කිරීම වැදගත් වේ.

නිගන්ඨනාථ පුත්තතුමන්ගේ ප්‍රධාන දායකයකු වූ උපාලි ගෘහපති නැමැති ජෛන ආගමික තරුණයා බුදුහිමි බැහැදැක පැහැදී, බුද්ධ අනුගාමිකයකු වීමට අවසර ඉල්ලී ය. මෙවිට අප බුදුරජාණන් වහන්සේ ඔහුට, නැවත මේ ගැන හොඳින් කල්පනාකර බලන්නැයි වදාළහ. උපාලි ගෘහපති තමුන් හොඳට කල්පනා කිරීමෙන් මෙම තීරණය ගත් බව පැවසූ පසුත්, එක් පොරොන්දුවක් මත ඔහුට බෞද්ධ වීමට අවසර දෙන බවට බුදුහිමි වදාළ සේක. එනම් තම පෙර ගුරුවරයාට, මින් පෙර දැක්වූ සැලකිලි, ලබා දුන් අනුග්‍රාහය හා දායකත්වය එසේම වෙනසක් නොකොට දිගටම කරගෙන යන්නේ නම් පමණක්, තම අනුගාමිකයෙක් බවට පත් වීමට අවසර ලැබෙන බව වදාළ සේක.

එම ආදර්ශය අනුගමනය කරමින් ධර්ම දූත ප්‍රචාරයේ යෙදෙන බෞද්ධ ධර්ම දේශකයන් වහන්සේලා කිසි විටෙකත් බලෙන් හෝ අවස්ථාවාදීව අන්‍යාගමිකයන් බුදුදහමට හරවා නොගනිති. එසේම තමා මුලින් සිටි ආගමට අගෞරව නොකර ගෞරව කරන ලෙසට ද උපදෙස් දෙයි. මෙවිට එම අන්‍යාගමිකයන් බුදු දහම වැළඳගනුයේ නිදහසේ තම අවබෝධයෙන් හා ස්ව කැමැත්තෙන් යුතුව පැහැදුනු සිතකිනි.

**මතු සම්බන්ධයි**

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com